# ශ්‍රී ලංකාවේ ආදිවාසීන්ගේ වෙදකම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (දඹානේ ආදිවාසි ගම්මානය ඇසුරින්)

කෙසෙල්පොත විමලධම්ම හිමි*

ස්වදේශී ආදිවාසි ජනතාව ලෙස හඳුනා ගනු ලබන්නේ වැදි ජනතාව ය. ව වැදි යන සිංහල වචනය පාලි භාෂාවෙන් ව්‍යාධ හෙවත් විදින්නා යන අර්ථයෙන් බිඳී ආවකි. ව්‍යාධ දෙවියා යනු දඩයම්කරුගේ දෙවියා ය. මේ අනුව වැද්දා යන්නෙන් දඩයක්කරුවා යන අර්ථය ද ගෙන දෙයි. වැදි යන්න වනචාරි හෙවත් වනයේ හැසිරෙන්නා යන අර්ථය ද ගෙන දෙයි. මෙහි දී අධ්‍යයනයට ලක්වන්නේ විවිධ උගතුන්ගේ පර්යේෂණ අධ්‍යයන මඟින් විමසුමට ලක් කළ හා සහභාගිත්ව නිරීක්ෂණය මඟින් ය. එහි දී ශ්‍රී ලංකාවේ ආදිවාසින් හඳුනා ගැනීම, ආදිවාසින්ගේ වෙදකම හඳුනා ගැනීම, ආදිවාසීන්ගේ වෙදකම බෙදී ගොස් ඇති අංශ පිළිබඳ ව අවධානය යොමු කිරීමට ද අපේක්ෂිත ය. මෙහි දී ප්‍රධාන වශයෙන් ආගම, පුදපෙත්, ශාන්තිකර්ම පිළිබඳව ද අවධානය යොමුකරනු ලැබේ. වර්තමානයේ වැදි ජනයා පිළිබඳ සිදුකළ බොහෝ පර්යේෂණ දෙස අවධානය යොමු කිරීමේදි පෙනී යන කරුණක් වනුයේ ඔවුනගේ ආගම, සිරිත්විරිත්, ආහාර, උත්සව යටයුතු ආදී බොහෝ දේ පිළිබඳව තොරතුරු විවිධ පර්යේෂණ මඟින් එක් රැස්කොට ඇති බව ය. මෙම අධ්‍යයනයේ දී අධ්‍යයනයට ලක්කරන ප්‍රදේශය වනුයේ ශ්‍රී ලංකාවේ ආදිවාසි නායක ඌරු වරිගේ වන්නිල ඇත්තන්ගේ වර්තමාන වාසස්ථානය වන දඹාන ප්‍රදේශය යි. වතුයාය, ගුරුකුඹුර, වටවන, කොටබකිනිය, සොරබොර, මකුලගොල්ල හා සේරාන, දඹාන ප්‍රදේශයට අයත් ගම්මාන වේ. පරම්පරා 07කට අදාළ පවුල් 350ට පමණ සීමා වුනු ආදිවාසින් මෙහි දැකගත හැකි ය. ඒ අනුව ආදි වාසි ජනතාව සතුන්ගෙන් සිදුවන අනතුරු සඳහා, කායික රෝග සඳහා, මානසික රෝග සඳහා වෙදකම භාවිත කර තිබේ. එසේ ම වෙදකම හා බැඳුනු අභිචාර විදිධ හඳුනා ගත හැකි ය. වැඩිදුරටත් මෙම අධ්‍යයනයෙන් විමසුමට ලක්වන්නේ ආදිවාසින්ගේ වෙදකම පවතින්නේ කෙසේ ද එහි ස්වභාවය හා විවිධාංගයන් මොනවා ද, වර්තමානයේ ආදිවාසි වෙදකම හා සිංහල වෙදකම අතර පවතින සම විෂමතා මොනවාද යන්නත් තාක්ෂණයේ දියනුවත් සමග ආදිවාසි වෙදකමේ ඉරණමත් කෙබඳු ද යන්න පිළිබඳව ය. මෙලස අධ්‍යයනයට ලක්කිරීමෙන් ආදිවාසින්ගේ සම්භවය පිළිබදව අවබෝදයක් ලබා ගෙන ඔවුන් ශ්‍රේෂ්ඨ පෞඪ ඉතිහාසයකට උරුමකම් කියන බව සමාජයට හඳුන්වා දිමත්, නූතන සමාජ පෙරළිය හා ආර්ථික වර්ධනය හමුවේ මෙම සමාජ ශීග්‍රයෙන් වෙනස්වීම නිසා ඒවා යම් පමණකට සුරක්ෂිත කිරීම, ආදිවාසින්ගේ සමාජ ආර්ථක්‍රමය වෙනස්වීමේ දී මතුවන ගැටලු නිරාකරණයට මෙන්ම ඒවායේ ප්‍රතිඵල හා බලපෑම් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට ද හැකිය. එසේම මෙතුලින් ඔවුන් විසින් චිරාත්කාලයක් රැගෙන ආ දැනුම් සම්භාරය සුරක්ෂිත කිරීමටද පිටුබලයක් වේ.

ප්‍රමුඛ පද :- ආදිවාසි ජනතාව, වෙදකම, සම්ප්‍රදායන්, ජනජීවිතය, දඹාන

* පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

keselpothawimala@gmail.com